## වසර 300 කට පෙර කතාවක් . . . . .

# රොබර්ට් නොක්ස් වෙළඳාමේ ගියහැටි

...... .. ......ඔහු අත තුට්ටුවක දු නැත. ඇඳුම් සියල්ල වැරහැලිව ගොසිණි. අන්තිමට ඉතිරි වූයේ හිස් වැසුම හා කොට කලිසම ද පමණි. උඩු කය වසා ගැනීමට තිබුණු එකම කමිසයෙන් ඔහු කුට්ටි සාක්කු වැනි ලොකු සාක්කු දෙකක් සාද කොට කලිසමට තබා නූල් ගසා ගත්තේ ය. ගම්බද කුඹුරුවල ගොයම් කැපෙන කාලය අත ළඟටම ලංව තිබිණි. ගැන්දෑ වන විට කුඹුරු යාය ඔස්සේ ඇවිදින්නට නොක්ස් ටිකෙන් ටික පටන් ගත්තේ ය. දකින කෙනෙක් හිතන්නේ ව්‍යායාමයක් හැටියට ඔහු ඇවිදින බවෙකි. කවුරුත් ළඟ පාතක පෙනෙන්න නැති විට නොක්ස් මදක් නැවති කලිසම් කොටයේ සාක්කු දෙකම වී අහුරු වලින් පුරවා ගනියි. වැඩිකල් ගත වූයේ නැත. නොක්ස් සතුව දූන් වී ගබඩාවෙකි.

ගම් වැසියන් දුර දිග නොබලන පිරිසක් බවද, පායන කාලයේ දි හෝ මොර සූරන වැසි වසින කාලයේ දී හෝ කෑම සඳහා යමක් ළඟ තබා ගැනීමට ඔවුන් උවමනාවක් නොදක්වන බවද ඔහුට වැටහී ගියේය. ඒ තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් නොක්ස් ගැමියන් ගේ වී ඔවුන්ටම විකුණා මුදල් ඉපැයිය.

වී විකුණා සෑහෙන මුදලක් හරි හම්බ කරගත් නොක්ස් ඉන් පසුව ධාන්‍ය වෙළෙන්දෙකු හැටියට ජීවිකාව ඇරඹිය. තෙත් කඳු බෑවුම් පෙදෙස් වලින් ලාබයට හාල් එකතු කළ හෙතෙම ඊශාන දිග වියලි පෙදෙස්වලට ඒවා ගෙන ගොස් විකුණා වැඩි මිලක් ලබා ගත්තේ ය. දිවයිනේ වැසියන් ගේ ප්‍රධාන ආහාරය බත් හෙයින් හාල් විකිණීමට ඕනෑම විටක දි ගැණුම්කරුවන් සොයා ගත හැකි බව දූන් ඔහුට සහතික ය.

### සගයෝ වෙළෙළදාමේයති.

........ නොක්ස් ගේ එදිනෙද ජීවිතයේ රඳා පැවැත්මට පොල් ගසින් ද අනුපමේය සේවයක් සැලසිණි. ගැමියකු සතුව පොල් ගස් හය හතකුත් කොස් ගසකුත්, එළදෙනකුත්, කුඹුරු කැබෙල්ලකුත් ඇත්නම් ජීවිතය ගෙන යාමට ඔහුට (ගැමියාට) වෙනත් දෙයක උවමනාවක් නැතැයි ගැමියන් අතර කියමනක් ඇත.

හාලුත්, පොලුත් යන දෙවගය නොක්ස්ගේ වස්තුව තර කිරිමට පදනම වූයේ ය. නොක්ස් මෙන් ම ඔහුගේ මිත්‍ර රුත්ලන්ඩ් ද (ස්ටිවන්) අසල් වාසීන්ට ප්‍රිය මනාප පුද්ගලයන් වූ නමුත් නොක්ස් එයින් සෑහීමට පත් වූයේ නැත.

නොක්ස් හා රුත්ලන්ඩ් යන සගයන් දෙදෙනා 1679 සැප්තැම්බර් 22 වැනිද ඇල දැත්ත නම් ගමේ සිට වෙළෙඳාම පිණිස පිටත් වූහ. හොඳට හඳ පායන දවස් වූ හෙයින් ඕනෑ නම් රාත්‍රි කාලයේ දි වුව ගමන් කිරිමට ඔවුන්ට හැකි විය. දිවයිනේ මධ්‍යම ප්‍රදේශය වෙත වෙළෙඳාමට යන බව නොක්ස් නම අසල්වාසියන්ට කල් තබාම කියා තිබිණි. හාල්, ගෙත්තම් කළ හිස් වැසුම්, මෙන් ම වනගත ගැණුම්කරුවන් කැමැති වෙනත් බඩු මුට්ටු ද බරට බරේ මිටි බැඳ ඔවුහු ගෙන ගියහ.

සෙංකඩගල (මහනුවර) සිට බටහිර දෙසට යා හැකි තරමේ දුර ගිය ඔවුන් දෙදෙන අනතුරුව නැගෙනහිරට බර වූයේ උතුරු දෙසට යන මඟට වැටිම පිණිස ය......... වන මහ ඔස්සේ පිය නගද්දි අසන්නට ලැබුණු පුවතෙකින් ඔවුන් ගේ ලොමු දැහැ ගැන්විණි. පුවත වූයේ, වනගත අනුරපුර නුවරින් රාජසිංහ රජුට ලැබෙන්නට ඇති බදු මුදල් අය කිරිමට රජු ගේ නියමය පිට රාජ පුරුෂයන් කණ්ඩායමක් ළඟ ළඟම එන බව ය. නොක්ස් හා රුත්ලන්ඩ් ගමන් කරන්නේද අනුරපුර දෙසට එකම මඟෙහිය. රාජ පුරුෂයන්ට හසු නොවිම පිණිස ඔවුනට කළ හැකිව තිබුණු එකම දෙය වන වැදි සැඟවිම පමණි.

### වනයෙන් එළියට.

............ සුදු ජාතිකයන් දෙදෙනාට ගෙයක් දෙරක් තවම හමු වූයේ නැත. මනුෂ්‍ය කට හඬක් තවම ඇසුණේ නැත. වන මහෙහි යළි ඉදිරියටම යද්දී හදිසියේ ම කුකුළකු හඬලන හඬ ඔවුන්ට ඇසිණි. ජනාවාසයක් වෙත තමන් ඉතා සමීපව සිටින බව ඔවුන් ඒත්තු ගත්හ. එය වනගත කුඩා ගමෙකි. ඔවුහු ගමට ඇතුළු වූහ. ‘සුදු ජාතිකයන් දෙදෙනා දුටු ගම් වැස්සෝ මහත් සේ මවිතව ඔවුන් වටකර ගත්හ. නොක්ස් තමන් ගෙනා බඩු මුට්ටු ගැමියන් හමුවේ බිම එළා පෙන්විය. ඒ අතර ඔවුන් අමතා සිංහලෙන් යමක් කතා ද කළේය. (නොක්ස් ඒ වන විට, සිංහළ දැන සිටි කෙනෙකි). ‘ආවේ කොහි සිට දැයි’ ගැමියන් ප්‍රශ්න කළ විට, මහනුවර සිට වෙළඳාම සඳහා තමන් දෙදෙන පැමිණි බව නොක්ස් කිවේ ය... .....